# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

7 ශ්‍රේණිය

## ඉතිහාසය

නම/ විභාග අංකයः ..........................................

කාලය පැය 2යි

### I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත් ගැළපෙන හෝ නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1) පැරණි සෙල්ලිපිවල හේන් හැඳින්වීමට භාවිතා කර ඇති නාමය වන්නේ
   1) හේන් 2) සෙහෙන් 3) පිටිබිම් 4) කනත්ත

2) අතීත ලංකාවේ පැවති කන්න තුනක් පිළිබඳව තොරතුරු දක්වා ඇති සෙල්ලිපියේ නම තෝරන්න.
   1) තෝනිගල 2) අඹගමුව
   3) දෙවනගල 4) සංගමු විහාරය

3) රුවන්වැලි සෑය අලංකාර කිරීමට පළඳනාවක් තැනීමට පබළු ගෙන්වා ගැනීමට රෝමාණුක දේශයට දූතයන් යැවූ රජතුමාගේ නම
   1) දුටුගැමුණු රජු 2) භාතිකාභය රජු
   3) වසභ රජු 4) IV වන උදය රජු

4) දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය රාජ්‍යයේ අගනුවර හැඳින්වූ නාමය වන්නේ
   1) මධුරාපුරය 2) කාංචිපුරය 3) විජය නගර් 4) තංජෝරය

5) අන්ධයින් හා රෝගීන් සඳහා ආරෝග්‍යශාලා හා ධාන ශාලා පිහිටවූ රජතුමාගේ නම තෝරන්න.
   1) බුද්ධදාස රජු 2) I උපතිස්ස රජු
   3) IV වන කාශ්‍යප රජු 4) I උදය රජු

6) මහා විජයබාහු රජතුමා පිළිබඳව තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍රයක් නොවන්නේ
   1) මිහින්තලා පුවරු ලිපිය 2) පනාකඩුව තඹ සන්නස
   3) මහා වංශය 4) අඹගමුව සෙල්ලිපිය

7) අනුරාධපුර රාජධානිය I වන රාජ රාජ විසින් ආක්‍රමණය කරන විට එහි සිටි පාලකයාගේ නාමය තෝරන්න.
   1) V වන මිහිඳු රජු 2) I වන උපතිස්ස රජු
   3) I වන විජයබාහු රජු 4) IV වන උදය රජු

8) රන්කොත් වෙහෙර ඉදිකරන ලද රජතුමා වන්නේ
   1) මහා පරාක්‍රමබාහු රජු 2) මහා විජයබාහු රජු
   3) I වන සේන රජු 4) නිශ්ශංක මල්ල රජු

9) ශක්තිමත් ආරක්ෂක බලකොටුවක් ලෙස ගාලු කොටුව ඉදිකරවන ලද විදේශීය ජාතිය වන්නේ
   1) පෘතුගීසීන්   2) ඉංග්‍රීසීන්   3) ලන්දේසීන්   4) චෝලයින්

10)සීගිරි බටහිර මඟුල් උයන "ප්‍රමද වනය" ලෙස නම් කරනු ලැබුයේ
   1) යුනෙස්කෝ සංවිධානය   2) H.C.P. බෙල් මහතා
   3) මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා   4) ශිරාන් දැරණියගල මහතා

- **11 සිට 15 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

11)ඉරිපිනියාව සෙල්ලිපියේ ……………………….. සෙනෙවියා පිළිබඳ තොරතුරු සඳහන් වේ.

12)සාලිය කුමරු උපන් කාලයේ ඇල්වී අස්වැන්න ඉහළ ගිය බව ………………………………… නම් පැරණි ග්‍රන්ථයේ සඳහන් වේ.

13)හෝපිටි ගම වෙළඳසැලේ පාලනය පිළිබඳව …………………………………… රජතුමා විසින් පනවන ලද නීති පිළිබඳව බදුලු ටැම් ලිපියේ තොරතුරු සඳහන් වේ.

14)………………………………………………… රජතුමා තම මවට උපස්ථාන කළ ආකාරය පිළිබඳව මහා වංශයේ තොරතුරු සඳහන් වේ.

15)මහා පරාක්‍රමබාහු රජතුමා විසින් සංඝ ශාසනය සමගි කොට තුන් නිකායේ සමගිය ඇති කළ බවට …………………………………………….. සාක්ෂි දරයි.

**(VII වන අග්ගබෝධි/ IV වන උදය/ බුද්ධ රාජ/ කුට්ඨක/ සීහල වත්ථු/ පොළොන්නරු කතිකාවත/ මහාවංශයේ)**

- **පහත 16 සිට 20 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

16)පණ්ඩුකාභය රජුගෙන් පසු මුටසීව රජුට රජකම හිමි වීම පියාගෙන් පුතාට රජකම හිමි වූ අවස්ථාවකි. (   )

17)අතීතයේ රට ලද්දන් ලෙස හඳුන්වා ඇත්තේ මුළු රටම පාලනය කළ පුද්ගලයන් හැඳින්වීමටය. (   )

18)"අත්තානි කණු"වල අතීතයේ යම් යම් පුද්ගලයින්ට හා ආයතනවලට විශේෂ බලතල හා වරප්‍රසාද ලබාදීම පිළිබඳව තොරතුරු සඳහන් වේ. (   )


19)දේශීය වෛද්‍ය දැනුම අස්පෘශ්‍ය ජාතික උරුම අතරට එක් වේ. (   )

20)සීගිරියේ වැදගත්කම සලකා 1988 දී යුනෙස්කෝ සංවිධානය විසින් එය ලෝක උරුමයක් ලෙස නම් කර ඇත. (   )

(ලකුණු 2x20=40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5කි.**




01)

(A) පහත සඳහන් ස්ථාන සපයා ඇති ලංකා සිතියමෙන් හඳුනාගෙන එයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියේ ඇති හිස්තැන මත ලියන්න.

i. ගෝකණ්ණතිත්ථ ……………

ii. පොළොන්නරුව ……………

iii. දඹකොළපටුන ……………

iv. කැළණි ගඟ …………… (ල 4x2=8)

පහත සඳහන් පින්තූර ඇසුරින් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.



(B) i. මෙම පිළිම වහන්සේ දැකිය හැකි විහාරය නම් කරන්න.

ii. එය ඉදිකර ඇති රාජධානි අවධිය නම් කරන්න.

iii. මෙම විහාරය කරවූ රජතුමාගේ නම ලියන්න.

iv. මෙම පිළිමය නෙලීමට භාවිතා කර ඇති මාධ්‍යය නම් කරන්න. (ල 4)



(C) i. මෙම නිර්මාණ අයත් වන කර්මාන්තය නම් කරන්න.

ii. මෙම කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලන ප්‍රදේශය නම් කරන්න.

iii. මෙම නිර්මාණ හැරුණු විට මෙම කර්මාන්තය ඇසුරින් සිදුකරන තවත් නිර්මාණයක් නම් කරන්න.

iv. මෙම නිර්මාණ සඳහා අමුද්‍රව්‍ය සපයා ගෙන ඇත්තේ කුමන ගසක වසන කෘමි සතාගෙන් ද? (ල 4)

02)

i. කෘෂිකර්මාන්තයේ දී භාවිත වන පහත සඳහන් වචනවල අර්ථය ලියන්න. (ල 2)

a) ගිණි යාතිකාව b) ගොයම් කොළය

ii. හෝපිටිගම වෙළඳසැලේ අකටයුතුකම් මැඩලීම උදෙසා පනවන ලද නීති ඇතුළත් බදුලු ටැම් ලිපියේ සඳහන් නීති දෙකක් ලියන්න. (ල 4)

iii. අතීත ලංකාවේ පැවති කර්මාන්ත දෙකක් නම් කර ඉන් එක් කර්මාන්තයක් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. එහිදී කර්මාන්තය සඳහා භාවිතා කළ අමුද්‍රව්‍ය, උපකරණ හා නිෂ්පාදනය කළ භාණ්ඩ වර්ග කිහිපයක් සඳහන් කළ යුතුය. (ල 5)

03)

i. ලංකාව තුළ සංවිධානය වී සිටි විදේශීය වෙළඳ ශ්‍රේණි දෙකක් නම් කරන්න. (ල 2)

ii. පහත සඳහන් වරායන් පිහිටි ප්‍රදේශ වර්තමානයේ දී හඳුන්වන නම් වරහන් තුළින් තෝරා ලියා දක්වන්න.

a) දඹකොළ පටුන b) ගෝකණ්ණතිත්ථ

c) ගොඩවාය d) මාතොට

(හම්බන්තොට/ ත්‍රිකුණාමලය/ මන්නාරම/ කන්කසන්තුරේ/ පුත්තලම) (ල 4)

iii.
a) සංස්කෘතිය යන්නට අයත්වන අංගයන් දෙකක් ලියා දක්වන්න. (ල 2)
b) මෙරට අතීත සමාජය් පැවති එකිනෙකාට උපකාර කිරීමේ හා ප්‍රතිඋපකාර දැක්වීමේ ගුණය අත්තම් ක්‍රමය තුළින් උදහරණ දක්වමින් විස්තර කරන්න. (ල 3)

04)
i. පහත a හා b ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න. (ල 2)
a) මානවම්ම කුමරුට උදවු කළ දකුණු ඉන්දීය රාජයේ නම
b) II වන සේන රජුගෙන් උදවු ලබාගත් දකුණු ඉන්දීය රාජ්‍යයේ නම
ii. රටේ මධ්‍ය පාලනයට සහය වූ නිලධාරීන් වර්ග 4ක් නම් කරන්න. (ල 4)
iii. අතීත ලංකාවේ රජකම පැවරුණු ආකාරයන් දෙකක් ලියා ඒ සඳහා උදහරණ එක බැගින් දක්වමින් විස්තර කරන්න. (ල 5)

05)
i. ලාංකීය රජවරුන් භාවිතා කළ චතුරාංගනී සේනාවෙන් සේනාංක දෙකක් නම් කරන්න. (ල 2)
ii. අතීත ලංකාවේ රජවරුන් සෙල්ලිපිවල සඳහන් කළ නීති වර්ග 4ක් ලියා දක්වන්න. (ල 3)
iii.
a) පැරණි රජවරුන් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී ජනතාවගේ සුභසෙත උදෙසා සිදුකළ කාර්යයන් දෙකක් නම් කරන්න.
b) මෙරට සෞඛ්‍ය පහසුකම් දියුණු කිරීමට රජවරුන් අනුගමනය කළ ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ල 5)

06)
i. මහා විජයබාහු රජුගේ මව්පියන් නම් කරන්න. (ල 2)
ii. චෝලයින් විසින් තමාට එරෙහිව ගොඩනැගෙන රෝහණයේ දේශපාලන බලය මර්ධනය කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ල 4)
iii. මහා විජයබාහු රජුගේ ජීවිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ දෙකක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ල 5)

07)
i. ජාතික උරුම බෙදා දැක්වෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ල 2)
ii. ඉහත සඳහන් කළ ජාතික උරුම වර්ග දෙක සඳහා උදහරණ හතර බැගින් වෙන වෙනම ලියන්න. (ල 4)
iii. ලංකාවේ නම් කර ඇති ලෝක උරුම දෙකක් ලියා ඉන් එකක් පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ල 5)

08)
i. මහා පරාක්‍රමබාහු රජු පිළිබඳ තොරතුරු දැක්වෙන සෙල්ලිපි දෙකක් නම් කරන්න. (ල 2)
ii. මහා පරාක්‍රමබාහු රජු සම්බන්ධයෙන් පහත තොරතුරු ලියා දක්වන්න. (ල 4)
a) රජුට එරෙහිව සටන් කළ රෝහණයේ රාජකීය කාන්තාවගේ නම
b) රජු විසින් ඉදිකළ විශිෂ්ඨතම වාරි කර්මාන්තය
c) ලංකාවට එරෙහි රාජ්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කළ බුරුම රජතුමා
d) රජතුමා විසින් කරවූ විහාරස්ථානයක නම
iii. මහා පරාක්‍රමබාහු රජුගේ ආර්ථික සේවාවන් දෙකක් ලියා කෙටි විස්තරයක් ලියන්න. (ල 5)